"කොළඹින් ඇවිත් මීගමුවේ කුඩු බෙදූ කත අත්අඩංගුවේ" යනුවෙන් ලංකාදීප පුවත්පතේ (06/29) සිරස්තලයක දැක්වී තිබිණි. එම සිරස්තලයේ ගැටළුවක් නැත. මෙම පුවතම එදින දිවයින (06/29) පුවත්පතේද දැක්වී තිබිණි. නමුත් දිවයින සිරස්තලයේ සඳහන්ව තිබුණේ, "මීගමුවට කුඩු බෙදන්න ආ මුස්ලිම් කත කුඩුත් සමඟම අත්අඩංගුවට" යනුවෙනි! පුවත් අන්තර්ගතය තුළද මෙම අත්අඩංගුවට ගැනුණු කාන්තාව මුස්ලිම් බව සඳහන්ව තිබිණි.
යම් පුවතකට සෘජුවම අදාළ නොවන්නේ නම් පුද්ගලයෙකුගේ හෝ පුද්ගල කණ්ඩායමකගේ වාර්ගිකත්වය පුවත සමගින් සඳහන් නොකළ යුතු බව දෙස් විදෙස් මාධ්‍ය ආචාර ධර්ම තුළ සඳහන් වේ. මෙවැනි ආචාර ධර්මයක අවශ්‍යතාවය වන්නේ, යම් වාර්ගිකත්වයන් සම්බන්ධ කොට ගනිමින් ඒකාකෘතික කිරීම් ඇතිවීම වැළැක්වීම උදෙසායි.
එසේ නම්, දිවයින පුවත් වාර්තාව සඳහා එම අත්අඩංගුවට ගැනුණු කාන්තාවගේ වාර්ගිකත්වය අදාළ වන්නේ කෙසේද? එම සිදුවීමම ඉදිරිපත් කරනා ලංකාදීප පුවතට එම වාර්ගිකත්වය කිසිසේත්ම අදාළ නොවූ බවද මෙහිදී අවධාරණය කළ යුතු වේ. ඒ අනුව බලන විට, දිවයින පුවත්පත මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් සිදුකර තිබෙනවා නොවේද?
#MediaEthicsSL #lka #SinhalaNews #Lankadeepa #Divaina